# 11. ඉස්ලාමීය මාස

ඉස්ලාම් අපගේ නිසි මහ ය
දෙවියන් අපහට දුන් මහ ය
දොළොස් මසක් වේ අවුරුද්දේ
ඉස්ලාමීය දින දර්ශනයේ

මුහර්රම් අපගේ මුල් මාසේ
ඉන් පසු එන්නේ සෆර් මසයි
තුන්වන මස රබීඋල් අව්වල්
අපගේ නබි තුම උපන් මසයි

සතර වැන්න රබීඋල් ආහිර්
ජමාදුල් අව්වල් පස්වැන්නයි
ජමාදුල් ආහිර් සයවැන්නයි
සත්වැනි වන්නේ රජබ් මසයි

ෂඃබාන් මාසය අටවැන්නයි
රමළාන් මාසය නවවැන්නයි
උපවාසය අප රැක ගන්නේ
උතුම් වූ නවවැනි මේ මාසේ

ෂව්වාල් මාසය දසවැන්නයි
ඉන් පසු එන්නේ දුල් කඃදා
අවසන් මාසය දුල් හජ් වන්නේ
මතකයේ රඳවමු මේ හැම දේ

## පැවරුම්

**පහත දී ඇති වචන යොදා හිස්තැන් පුරවන්න.**

**රබීඋල් අව්වල්, රමලාන්, මුහර්රම්, ෂව්වාල්, දුල්හජ්**

1. මුස්ලිම් නව අවුරුද්ද ...................... මාසයේ උදා වේ.
2. අපි ..................... මාසයේ උපවාසය රකිමු.
3. ............................. මාසයේ හජ් උත්සවය සමරනු ලැබේ.
4. නබි සල්ලල්ලාහු අලෙහි වසල්ලම් තුමා උපත ලැබුවේ ............ මාසයේ දී ය.
5. රමළාන් අවුරුද්ද සමරන්නේ ...................... මාසයේ ය.